# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/72 - 2018 ඔක්තෝබර් මස 05 වැනි සිකුරාදා - 2018.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස: අධිකරණ

## ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම්

### 2018 ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා සහ ඔහු විසින් එම ව්‍යවස්ථාව යටතේ නම් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයන් විසින් සාදනු ලැබූ රීති

1. ඩබ්ලිව්. පී. ජී. ඩෙප්, අග්‍ර විනිශ්චයකාර
2. එස්. ඊ. වනසුන්දර, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර
3. බී. පී. අළුවිහාරේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර
4. කේ. එස්. ජේ. ද ආබෲ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

කොළඹ දී ය.

1. මේ රීති 2018 විනිශ්චයකාරවරයන්ගේ හා නීතිඥවරයන්ගේ නිල ඇඳුම පිළිබඳ රීති යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ රීති මගින් 1978 විනිශ්චයකාරවරයන්ගේ හා නීතිඥවරයන්ගේ නිල ඇඳුම පිළිබඳ රීතිවල 7 වන රීතිය ඉවත් කරමින් ඒ වෙනුවට නව රීතියක් ආදේශ කරමින් සංශෝධනය කරනු ලබන අතර, අග්‍ර විනිශ්චයකාරවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට බලාත්මක වන්නේ ය.

1978 විනිශ්චයකාරවරයන්ගේ හා නීතිඥවරයන්ගේ නිල ඇඳුම පිළිබඳ රීතිවල 7 වන රීතිය ඉවත් කරමින් හා ඒ වෙනුවට නව රීතියක් ආදේශ කරමින් කරන සංශෝධනය

7. කාන්තා නීතිඥවරියන් පහත සඳහන් ඇඳුමකින් සැරසී සිටිය යුතු ය.

සුදු, කළු, අලු හෝ රත්නිල් පැහැති සාරිය සහ හැට්ටය හෝ දණහිස් මට්ටමට පහළ සුදු, කළු, අලු හෝ රත්නිල් පැහැති ගවුම, හෝ කළු කබාය සහ වළලුකර දක්වා දිගු කළු කලිසම සහ කලිසමට යට කරන ලද කොළරය හා උස් කර සහිත අත්දිග සුදු කමිසය සහ කළු ලෝගුව


1A - G 28675 — 12 (2018/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ගර්භනී ඇඳුම, සුදු අත්දිග කමිසය සමඟ දණහිස් මට්ටමට පහළ උස් කර සහිත කළු ගවුම සහ කළු කබාය හෝ කළු ලෝගුව සමඟ ඉහත දක්වා ඇති නිවැරදි වර්ණයෙන් හෙබි සාරිය සහ හැට්ටය වේ.

ඩබ්ලිව්. පී. ජී. ඩෙප්
අග්‍ර විනිශ්චයකාර

එස්. ඊ. වනසුන්දර
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

බී. පී. අළුවිහාරේ
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

කේ. එස්. ජේ. ද ආබෲ
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

10 - 1197

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.